| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.07 පැය 0700 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out / 667/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ හිඹුටාන ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත. ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන පහල හිඹුටාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. ගංජා හේනක් වැටලීම - පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුර.**

2025.04.06 වන දින උදෑසන කාලයේ හල්දුම්මුල්ල පොලිස් වසමේ බසදුලුදෙන රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **අක්කර ½ ක පමණ භූමි ප්‍රමාණයක වගා කර තිබූ ගංජා හේනක් වටලා** ඇත.

මෙම වැටලීමේදී අඩි දෙකක් පමණ උස ප්‍රමාණයෙන් යුතු ගංජා ගස් 3100 ක ප්‍රමාණයක් ගලවා විනාශ කර ඇත. මෙම ගංජා හේන පවත්වාගෙන ගිය සැකකරුවන් අත්අඩංගුවට ගැනිමට හල්දුම්මුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 378 ක්, ගෝඩා ලීටර් 3683 ක්, තඹ දඟර 12 ක්, බැරල් 30 ක්, හා බුලි 12 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පමුණුගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන මුතුරාජවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුර.**

2025.04.06 වන දින සවස් කාලයේ අරලංගවිල පොලිස් වසමේ නිදන්වල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරලංගවිල කඳවුරේ නිලධාරීන්

කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **බලපත්‍ර නොමැතිව ලොරි රථ දෙකකින් වැලි කියුබ් 06 ක් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ලොරි දෙක ද සමඟ අත්අඩංගුවට** ගෙන අරලංගවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 වයසේ පසු වන නිදන්වල සහ මුරුතැන්ගේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අරලංගවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා අරලංගවිල කඳවුර.**

2024.04.06 වන දින සවස් කාලයේ දෙහිඅත්තකණ්ඩිය පොලිස් වසමේ නවගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා අරලංගවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද දුම්වැටි 543 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙහිඅත්තකණ්ඩිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**06. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කායර් බලකා සංවිධානාත්මක අපරාධ මධර්න ඒකකය.**

2025.04.06 වන දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ මුතුරාජවෙල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා සංවිධානාත්මක අපරාධ මධර්න ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 30 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පමුණුගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**